# ECHO OF HIS CALL

ECHO OF HIS CALL REACHING NATIONS SINCE 1969

1969 TO 2029

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XIX — YEAR OF OUR LORD JESUS CHRIST, 2025 NOVEMBER — Issue No. 12


## ශුද්ධවූ බයිබලය

### (ගීතාවලිය 96:7-13)

07. මනුෂ්‍ය වර්ගයෙනි, ස්වාමීන්ට දෙව්, මහිමයත් බලයත් ස්වාමීන්ට දෙව්.

08. ස්වාමීන්ගේ නාමයට ප්‍රිය යුතු මහිමය දෙව්. පූජාවක් රැගෙන උන්වහන්සේගේ මණ්ඩපවලට ඇතුල්වව්.

09. ශුද්ධකමේ අලංකාරයෙන් ස්වාමීන්ට නමස්කාරකරව්. පොළොවේ සියල්ලෙනි, උන්වහන්සේ ඉදිරියෙහි වෙවුලමින් සිටිව්.

10. ස්වාමීන්වහන්සේ රජකම් කරනසේක කියාත්, නොසෙලවෙන ලෙස ලෝකය පිහිටා තිබේය කියාත්, උන්වහන්සේ මනුෂ්‍ය වර්ගයන් සාධාරණකමින් විනිශ්චය කරනසේක කියාත් ජාතීන් අතරේ කියව්.

11. ආකාශය සන්තෝෂවේවා, පොළොව ප්‍රීතිවේවා; මුහුදත් එහි පූර්ණකමත් ගර්ජනාකෙරෙත්වා;

12. කෙත සහ එහි ඇති සියල්ලද ප්‍රීතිමත් වේවා; එවිට වනයෙහි සියලුරෑ ගස් ස්වාමීන් ඉදිරියෙහි ප්‍රීතියෙන් ගී කියන්නේය.

13. මක්නිසාද උන්වහන්සේ එනසේක, පොළොව විනිශ්චයකරන පිණිස එනසේක. උන්වහන්සේ ධර්මිෂ්ඨකමින් පොළොවද, ස්වකීය සැබෑකමින් මනුෂ්‍ය වර්ගයන්ද විනිශ්චයකරනසේක

## ඔබ අවදියෙන් සිටිනවාද? නැතිනම් නිදා සිටිනවාද?

### ARE YOU AWAKE OR ASLEEP?

*Sis. Angel*



ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් ඔබ සියලු දෙනාටම ආසිරි පතමි!

දෙවි පියාණන්වහන්සේ අප සැම දෙනාටම ස්වර්ගීය ආශිර්වාද වලින් ආත්මික ලෙස ආශිර්වාද කර තිබේ.

කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව තුළින් ඔබ සැම දෙනා සමගම සම්බන්ධ වීම ගැන මා ඉතා සතුටුවෙමි. තවද ඔබගේ ආත්මයෙන් ස්වාමීන් වහන්සේ තුළ සපලවත් වන ලෙස ඔබ සියලු දේ තුළින් සඵල වන්නේ කියා මා ප්‍රාර්ථනා කරමි.

අප 2025 වන වර්ෂය නිමා කිරීමේ ආසන්නයෙහි අප රැඳී සිටිති. මෙම වසර ඉතා ඉක්මනින්ම ගෙවී ගියේය. අපි මෙම වසර දෙස ආපසු හැරී බලන විටදී දෙවියන් වහන්සේ අපහට කළා වූ සැම ආශිර්වාද නිසා ස්තුති කරමු. එලෙසම අප මුහුණ දුන් සියලු අභියෝග නිසාත් එම අභියෝග තුළ උන්වහන්සේ අපව මෙතරම් දුර ගෙන රැගෙන ආනිසාත් උන්වහන්සේ අපව සවිමත් කළ නිසාත් අප උන්වහන්සේට ස්තුති කරමු.

මෙම වසර පුද්ගලික ලෙස අපගේ පවුලට ඉතා අභියෝගමත් වර්ෂයක් වූයේය. මගේ එකම සහෝදරයා මියගිය වේදනාව තවම අපගේ හදවත් තුළ රැඳී තිබෙයි. ඔහු දෙවියන් වහන්සේට සේවය කළ දේවදාසයෙක්ය. මගේ

3 වෙනි පිටුව ...




Echo of His Call

Christian YouTube Channel!

An opportunity to pray with Pr. S. Sam Selva Raj!

Message & Prayer in 5 minutes!!

English, Hindi, Tamil & Telugu

Every day – From 2.00 A.M.

Tamil Sunday Service – 8.30 A.M.

★ Please Subscribe and Share ★

# ECHO OF HIS CALL - (Marching towards 60th year)

Estd. 1969

## from your dearly beloved brother...





"ස්වාමීන් කෙරෙහි බලා සිටින සියල්ලෙනි, ශක්තිමත් වව; තොපගේ සිත ධෛර්යවත් වේවා" (ගීතාවලිය13:24)


### OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

HON. EDITOR-IN-CHIEF

Rev. Dr. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.

EX MANAGING EDITOR

Pastor Alex Samson Sam, B.Th., M.Div.

GENERAL MANAGER

Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM, MBA.

ADMINISTRATION

Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech, M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)

EDITORIAL BOARD

Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Rev. Dr. K.R. Rajasekaran
Rev. Dr. William Robert, Ph.D., DD, D.Lit.



EDITOR, PUBLISHER & PRINTER

Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858
95661 31858

E.MAIL

sam@echoofhiscall.org
biblecor@yahoo.co.in

WEBSITES

www.echoofhiscall.org
www.stpaulsmatriculation.org

YOUTUBE CHANNEL

Echo of His Call


**ස්වාමීන්වහන්සේ තුළ ප්‍රිය මිත්‍රවරුනි,**



ක්‍රිස්තුස් වහන්සේ තුළ ප්‍රේමණීය සහෝදර සහෝදරියනි, ආශිර්වාදමත් මාවතෙහි අපව දිගටම ගෙන ගෙනයන්නාවූ අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ අනර්ඝ නාමයට මහිමය හා ගෞරවය වේවා!

පසුගිය මාසය තුළදී අප බොහෝ අභියෝගවලට මුහුණ දුන්නෙමු. අපගේ මුද්‍රණ යන්ත්‍රවල නොයෙකුත් කාර්මික දෝෂයන් තිබූ නිසාත් පුද්ගලික ලෙස රෝගාතුරුවීම්, අපගේ සහකාර සේවකයන් රෝගාතුරවීම් ආර්ථික ප්‍රශ්න යන මේ සැම දේ නිසා අපගේ සේවාවන් මන්දගාමීව කරගෙන යාමට සිදුවිය. නමුත් ස්වාමීන් වහන්සේගේ බලවත් හස්තය කරන කරනකොට ගෙන සැම අභියෝගයක්ම අපට ජයග්‍රහණය කර ගැනීමට හැකි වූ අතර එතුළින් උන්වහන්සේගේ නාමය මහිමයට පත් කිරීමට අපට සාක්ෂියක් ද විය. අද දෙවියන් වහන්සේ අපට තවත් ඉදිරියට යන පිණිස ශක්තිය හා බලය දී තිබේ.

ඔබ සැම දෙනාගේම යාච්ඤාව අපගේ මෙම සේවාව කෙරෙහි බලාපොරොත්තු වෙමු. කරුණාකර අපගේ සභාවේ සේවාවන් උදෙසාත් ධර්මදූත සේවය කරන්නා වූ අය නිසාත් මුද්‍රණාලයේ කාර්යය මණ්ඩල නිසාත් කාර්යාලයේ සේවය කරන්නාවූ සේවකයින් නිසාත් නෙහෙමියා බයිබල් විද්‍යාල සහ එහි උගන්වන්නා වූ සියලු ගුරුවර ගුරුවරියන් නිසාත් ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේශන් පාසල උදෙසාත් යාච්ඤා කරන්න.

මේ දිනවලදී බොහෝ ප්‍රදේශවල සේවය කරන පිණිස අපිට සේවක සේවිකාවන් අවශ්‍යව තිබේ. අපගේ ප්‍රධාන පාලකතුමාගේ ජීවිත කතා පොත ඉක්මනින්ම නිමා කිරීමටත් අපට පැවරී තිබෙන අනෙකුත් සියලු වගකීම් ඉටු කිරීමටත් ඔබගේ යාච්ඤාව අප බලාපොරොත්තු වෙමු. පූර්ණ කාලීන සේවයට තවත් අය කැපවන පිණිස ද යාච්ඤා කරන්න.

මෙම අන්තිම කාලවකවානුවේදී බොහෝ දේවදාසයින් වැරදි මාර්ගවලට ගොස් වැරදි දේ උගන්වයි. එම නිසා උන්වහන්සේගේ ආත්මයාණන් වහන්සේ ඔවුන් වෙත වගුරුවා ආත්මික ලෙස දේව දාසයන් වර්ධනය පිණිස යාච්ඤා කරන්න.

*In Christ Jesus, your servant,*

***Pr. S. Sam Selva Raj,*** E.mail : sam@echoofhiscall.org


Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) ▫ BIBLECOR - Postal Courses (3 languages) ▫ YouTube Ministry ▫ Online Courses ▫ Theological Correspondence Courses (2 languages) ▫ Church Planting ▫ Nehemiah Bible Colleges ▫ Gospel Printing Press ▫ Great Commission Partners ▫ St. Paul's Matriculation School ▫ Crusades ▫ Community Development

*1 පිටුවෙන්....*

දෙමව්පියන් ඉතා සමීපයෙන් ප්‍රේම කළ එකම පුතුයාය. මෙවැනි වේදනාකාරී අත්දැකීමක් තුළ දෙවියන් වහන්සේගේ කරුණාව අපිට සැහෙන්නේය. එවැනි අමාරු කාලයන්වලදී අපහා සමග සිටයත් ඔබ සැම දොනාටම අප ස්තුතිවන්ත වෙමු.

පසුගිය මාසයේදී මෙම සඟරාවට මා ලියනු ලැබූ ප්‍රධාන ලිපියෙ හි මාතෘකාව වූ *"දෙවියන් වහන්සේගේ ආශිර්වාදය ලබා ලබාගන්න පිණිසස අපි අපගේ හදවත ආරක්ෂා කරගැනීමට අවශ්‍යය"* යනුවෙනි. දේව වචනය මෙහෙහි කරන විට *'ආරක්ෂා කරගන්න'* කියා පවසන්නේ දෙවියන් වහන්සේ අපව කැඳවා තිබෙන්නේ මුරකාරයන් හැටියට බවය. එසකියෙල් 3:17 හි සඳහන් කර තිබෙන ආකාරයට: *"මනුෂ්‍ය පුත්‍රය, ඊශ්‍රායල් වංශයට නුඹ මුරකාරයෙකු කෙළෙමි............"* දෙවියන්වහන්සේ අපව මුරකාරයන් ලෙස අපගේ සභාවට අපගේ පවුල්වලට හා අපගේ නගරයට අපව කැඳවා තිබේ.



**God has placed us as watchmen over our families, our Churches, our cities, and our nations**

මුරකාරයන්ට නිහඬව සිටිමට නොහැකි බව දේව වචනය පවසයි. *"එම්බා යෙරුසලම, නුඹේ පවුරු පිට මුරකාරයන් සිටෙව්වෙමි; ඔවුහු රෑවත් දවල්වත් කොහෙත්ම නිශ්ශබ්ද නොවන්නෝය. ස්වාමීන් වහන්සේට මතක් කරවන තැනැත්තෙනි,"* *(යෙසායා 62:6)* යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඉක්මනින් පැමිණෙයි. එබැවින් අපට නිහඬව සිටිමට නොහැකිය.

විශ්වාසවන්ත මුරකාරයා නිතරම අවදියෙන් සිටින්නට අවශ්‍යය. ඔහු අවදියෙන් සිටින්නේ අවධානයෙන් ඇහුම්කන් දී අනතුරු පැමිණෙන විට අවදියෙන් සිටින පිණිසය. අපව කැඳවා තිබෙන්නේ අවදියෙන් සිටිමටයි. ආත්මික ලෙස අවදියෙන් සිටින පිණිසයි. අප ඉදිරියේ කරදරයන් පීඩාවන් පැමිණි විට ඒ ගැන අප අවදියෙන් සිට අවවාද කරන පිණිසයි. අප විශ්වාසවන්තව මේ වැඩිය කළ යුතුය. එසකියෙල් 33:6 හි අපට මෙසේ පවසයි: *"නුමුත් මුරකාරයා කඩුව පැමිණෙනවා දැක සෙනඟට දන්වන ලෙස හොරණෑව නොපිඹ සිටියොත්....... ඔහුගේ ලේ මුරකාරයාගේ අතින් අය කරන්නෙමි කියාපන්න."* යෙරමියා 51:12 හි අපට මෙසේ පවසයි; *"....... මුරපළ සවිකර මුරකාරයන් සිටවා රහස් සේනාව සූදානම් කරපල්ලා ......."*

අන් අයට අවවාද කිරීමට පමණක් නොව අපගේ ජීවිතය ද ආරක්ෂා කරගන්න කියා මෙහිදී අපට අවවාද කරයි. අපිට ඇතිවෙන බොහෝ පීඩා හා පරීක්ෂා නිසා දෙවියන් වහන්සේගේ සැලැස්ම හා අරමුණෙන් අපව වෙනත් දිශාවකට ගෙනයාමට පුළුවනි. අප අප අවදියෙන් නොසිටියහොත් ඉතා පහසුවෙන් අපව වැටී යාමට පුළුවනි. දෙවියන් වහන්සේගේ මුරකාරයෙක්ව සිටින පිණිස උන්වහන්සේ අපව කැඳවා තිබෙයි.

අපිට තිබෙන ප්‍රශ්නය නම්, සැබැවින්ම දෙවියන්වහන්සේ අපට ආරක්ෂා කරන්න කියා පැවසූ දෙයට අප අවංකව මුර කාරයන් ලෙස ක්‍රියා කරනවාද? මුරකාරයෙකුට තිබිය යුතු සුදුසුකම නම් විශ්වාසවන්තකමත් අවදියෙන් හා අවධානයෙන් සිටීමත්ය. ඉතා කුඩා දෙයක් සිදුවන විටත් අප අවධානයෙන් සිටිය යුතුයි.




***We must be alert or aware of what is happening around us***

අප අවධානයෙන් සිට දුර්වලතැන් සවිමත් කළ යුතුයි. අද අප අවදියෙන් නොසිටින නිසා අප අවට සිදුවන දේ ගැන අපට කිසිම අවබෝධයක් නැත.

මේ අවසාන කාලයේදී දෙවියන්වහන්සේ අපට කතාකර පවසන්නේ, ආත්මික ලෙස අවදියෙන් සිටින පිණිසය.

## 1). නිදා සිටින්නෝ කවුද ?



යේසුස් වහන්සේ මෙලෙස පිළිතුරක් ලබාදෙයි, *"මා විසින් ඔවුන්ට සුව නොකරන පිණිස, මේ සෙනඟගේ සිත් දැඩිව තිබේ. ඔවුන්ගේ කන් හොඳට නැසී, ඔවුන්ගේ ඇස් පියාගෙන සිටිති යනුයි." (මතෙව් 13:15)*

එනම් මේ අයගේ හදවත ඉතාම දැඩි වී තිබේ. ඔවුන්ට ප්‍රේමයේ බලාපොරොත්තුවේ හා ධර්මිෂ්ඨකමේ පණිවිඩයක් ලැබුණත් ඔවුන් එය පිලිනොගෙන තමාගේම මාර්ගයෙහි ගමන් කරති. දේව වචනය පවසන පරිදි; ඔවුන් මේවා දකින්න අකමැති නිසා ඔවුන්ගේ දැස් වසාගෙන සිටිති. මෙවැනි අය ගැන දෙවියන්වහන්සේ පවසන්නේ; 'ඔවුන්ගේ ඇස්'




***Our hearts must to hear God's voice***

පියාගෙන (හදින්) සිටිති', කියාය. ඔවුන් මගේ හදවතින් අහක්ව සිටින බව යේසුස් වහන්සේ පවසයි. අපගේ හදවත දේව හඬට ඇහුම්කන් නොදී සිටිනවා නම්, අප ආත්මික ලෙස නිදා සිටින අයට සමාන වෙයි. දෙවියන්වහන්සේගේ කාරුණාවන් අපට දැකීමට බැරිව සිටිනවා නම් අප ආත්මෙක ලෙස නිදාගෙන සිටියි.

## 2). අප නිදාගෙන සිටින විට සිදුවන්නේ කුමක්ද?

මතෙව් 13 වන පරිච්ඡේදයෙහි අපට පෙනී යන්නේ; ස්වාමියා තමාගේ ඉඩමේ බීජ වපුරා තමාගේ සේවකයින්ට ඒ රැක බලා ගන්නය කියා පවසනු ලැබූ



***While the watchmen slept, the enemy came quietly, sowed weeds among the wheat***

නමුත් මුරකරුවන් නිදාගෙන සිටින විට සතුරා පැමිණ තිරිඟු අතර කිරිඳි වැපිරුවේය. තිරිඟු වැඩෙන්ට පටන් ගත් විට වැඩ කරන අය තිරිඟු අතර කිරිඳින් එකට වැඩෙන බවට දුටුවෝය. මතෙව් 13:25හි මෙසේ සඳහන් කරයි. *''මනුෂ්‍යයන් නිදා සිටියදී ඔහුගේ සතුරා ඇවිත් තිරිඟු අතරේ කිරිඳි වපුරා ගියේය.''* මේ ආකාරයට අප නිදා සිටින විට සතුරා වැරදි දේ අපගේ ජීවිතයට වපුරනු ඇත.

## 3). නිදා සිටින විටදී සතුරා පැමිණෙයි.

මෙම වචනය දෙස අප ඉතා ගැඹුරු ලෙස බැලුවහොත් ඔවුන් නිදා සිටින විට සතුරා පැමිණියේය. රාත්‍රී යාමයේදී සියල්ලෝ නිදා සිටින විට සතුරා පැමිණියේය. එබැවින් මුරකරුවෝ අවදිව සිටිය යුතුයි. නමුත් ඔවුන් මෙම අවස්ථාවෙහි නිදා සිටියේය. ආත්මික ලෙස අවදියෙන් සිටිය යුතු අප නිදා සිටියහොත් එම අවස්ථාවෙන් සතුරා අයුතු ප්‍රයෝජනය ගනු ඇත.

එබැවින් දේව වචනය අපට මේ ගැන මෙසේ පවසයි;

''......අවදියෙන් සිට යාච්ඤා කරන්න ........'' (මතෙව් 26:41)

''බොරු අනාගතවක්තෘවරුන්ගෙන් ප්‍රවේසම් වියල්ලා .......'' (මතෙව් 7:15)

''......සියලු ආකාර ලෝභකමෙන් ප්‍රවේසම් වෙන්ට බලා ගනිල්ලා ...'' (ලූක් 12:15)

''.......යාච්ඤාවෙහි අවදිව සිට නොකඩව එහි පැවතියල්ලා. (කොලොස්සි 4:2)

*''එබැවින් අවදිව සිටපල්ලා.........'' (මතෙව් 24:42)*

ඉහත සඳහන් සෑම පද වලින් වලින්ම අපට පවසන්නේ අප සෑම විටම අවදියෙන් සිටිය යුතු බවයි. මෙම උපමා කතාවෙහි සඳහන් කර ඇති සතුරන් ඔවුන් වෙතට පැමිණුනේ සේවකයින් නිදා සිටින විටදීය.

ප්‍රිය මිතුවරුනි, අප නොසලකා සිටින අවස්ථාවේදීත් අප කිසිම ඕනෑකමක් නොමැතිව සිටින විටදීත් අප ආත්මිකව අධෛර්යයට පත්ව සිටින විටදීත් සතුරා අප වෙතට පැමිණෙනවා ඇත. ඔහු කාව ගිලගනිම්දෝයි. කියා සිතමින් ගොරවන සිංහයකු මෙන්ම ඔබ මොබ ඇවිදිමින් සිටියි. එම නිසා අප නිදානොගෙන අවදිව සිටිය යුතුයි.

අප ආත්මික ලෙස දෙවියන් වහන්සේගේ හඬට සංවේදීව සිටිමින් අවදිව සිටින්නේ කෙසේද? එනම්; අපි

....Contd. to page 6




**ඉතා හදිසි දැනුම් දීමක්!**

ඉදිරියේදී කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව තැපැල් මගින් යැවීමේදී නොවැළැක්විය හැකි බාධාවන් ඇතිවීමට හැකිය. එබැවින් ඔබට කිසිදු බාධාවකින් තොරව කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව දිගටම ලබා ගැනීමට අවශ්‍ය නම්, කරුණාකර ඔබගේ නම, ලිපිනය, විද්‍යුත් තැපැල් සහ whatsapp අංකය සඳහන් කර ලිපියකින්, විද්‍යුත් තැපෑලෙන්, දුරකථන ඇමතුමකින් හෝ sms / Whatsapp පණිවිඩයක් හරහා ඉක්මනින්ම අප වෙතට ලැබෙන්නට සලස්වන්න.

ඔබගේ සහයෝගය අපට ඔබට හොඳින් සේවය සලසා දීමට උපකාරී වෙයි!

අපගේ ලිපිනය:

ECHO OF HIS CALL,
10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005, India
Cell: (+91) 98412 71858 / 98410 71858 E.mail: mm@echoofhiscall.org

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

බෙදා ගැනීම (ගලාති 6:2)
උපකාර කිරීම (රෝම 12:13) සහ
පුබුදු කිරීම (2 තිමෝති 1:6)

## ස්තූති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**නොවැ:19** - අපගේ විවිධ සේවාවන්වලට උන්වහන්සේගේ ආරක්ෂාව හා ආශිර්වාදය ලබාදුන් නිසා ස්තූති කරන්න.

**නොවැ:20**- අප කෙරෙහි උන්වහන්සේගේ නොසැලෙන සෙනෙහස හා ප්‍රේමය දැක්වීම නිසා ස්තූති කරන්න.

**නොවැ:21** - අපගේ මුද්‍රණාලය හරහා භාෂා 16ත් මෙම සඟරාව මුද්‍රණය කර ප්‍රකාශයට පත්කිරීමට සහ ඒවා සේවා ස්ථානයන් වලට යැවීමට අපට හැකියාව ලබා දුන් නිසා ස්තූති කරන්න.

**නොවැ:22**- පසුගිය මාසය පුරාවටම උන්වහන්සේගේ කරුණාවන්ත නායකත්වය ලබා දුන් නිසා ස්තූති කරන්න.

**නොවැ:23** - අපගේ මිෂනාරි වරුන්ට සහ ඔවුන්ගේ පවුල්වලට ආශිර්වාද වැගිරෙව් නිසා ස්තූති කරන්න.

**නොවැ:24**- අපගේ සභාවේ කාර්යාලයට නව ඇදහිලිවන්තයින් එකතු කළ නිසා ස්තූති කරන්න.

**නොවැ:25**- අපගේ සියලුම කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ට සහ ඔවුන්ගේ පවුල්වලට ආශිර්වාද කළ නිසා ස්තූති කරන්න.

**නොවැ:26**- අපගේ ප්‍රධාන පාලකතුමා විවිධ සේවාවන් හරහා සුභාරංචිය පතුරුවා හැරීමට ඔහුගේ කැපවීම දැක්වූ නිසා ස්තූති කරන්න.

**නොවැ:27**- කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ සෑම ක්‍රියාකාරකම්වලටම උන්වහන්සේගේ ආරක්ෂාව සහ ආශිර්වාදය ලබා දුන් නිසා ස්තූති කරන්න

**නොවැ:28**- අපගේ ප්‍රධාන සභාවේ සහ ශාඛා සභාවන්වල සබත් පාසලට අලුත් දරුවන් ලබාදෙමින් ආශිර්වාද කරන නිසා ස්තූති කරන්න

**නොවැ:29**- අපගේ YouTube නාලිකා සේවය හරහා ශුභාරංචියක් ළඟා නොවූ ප්‍රදේශවල ශුභාරංචිය පතුරුවා හැරීමට අපට උපකාර කළ නිසා ස්තූති කරන්න.

**නොවැ:30**- අපගේ යාච්ඤා හවුල්කරුවන්ට, දායක හවුල්කරුවන්ට, ඇදහිල්ලේ හවුල්කරුවන්ට, ජීවිත කාලය පුරා හවුල්කරුවන්ට සහ ඔවුන්ගේ පවුල් වලට උන්වහන්සේගේ කරුණාව ලබා දුන්නිසා ස්තූති කරන්න.

**දෙසැ:01**- අපගේ සහකාර කර්තෘවරුන්, සම්බන්ධීකාරකවරුන්ට සහ ඔවුන්ගේ පවුල්වලට උන්වහන්සේගේ ආශිර්වාදය ලබාදී තිබෙන නිසා ස්තූති කරන්න.

**දෙසැ:02**- අපගේ රෝහල් සේවයට දෙවියන් වහන්සේගේ හාස්කම් සිදුකර තිබෙන නිසා අපගේ හදපිරිස ස්තූතිය පුද කරමි.

**දෙසැ:03**- අකැඳවීමේ ප්‍රතිරාවය සඟරා සේවයට විශ්වාසවන්තව සහාය දක්වන කැප වූ සහකාර කතෘවරුන් නිසා ස්තූති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**දෙසැ:04**- මෙම පරම්පරාවේ තරුණයින් සහ දරුවන් සඳහා මැදිහත් වෙමින්, තරුණ හා ළමා ආරක්ෂණ සේවය සඳහා වන අපගේ ගෝලීය දැක්මට තවත් පුද්ගලයින් ඇතුළත් වීමට නියමිත නිසා යාච්ඤා කරන්න.

**දෙසැ:05**: අපගේ U Tube නාලිකා සේවය හරහා බොහෝ ආත්ම ගැලවෙන පිණිස යාච්ඤා කරන්න

**දෙසැ:06**- අපගේ ප්‍රධාන සභාවේ සහ එහි ශාඛා සභාවන්වල ඇදහිලිවන්තයින්ට ආරක්ෂාව සහ යහපත් සෞඛ්‍යයක් ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**දෙසැ:07**- ලොව පුරා සියලුම කිතුණු සේවාවන් හරහා මහත් පිබිදීමක් ඇතිවන පිණිස යාච්ඤා කරන්න.

**දෙසැ:08**- අපගේ ප්‍රධාන පාලකතුමා වන එස්. සෑම් සෙල්වරාජ් සහ ඔහුගේ පවුලේ සියලු දෙනාවම සෑම නපුරු බලවේගයකින්ම ආරක්ෂා කරන පිණිස යාච්ඤා කරන්න.

**දෙසැ:09**- අපගේ සියළු සේවාවන් පුළුල්වන පිණිස සහ ලොව පුරාම ශුභාරංචිය ප්‍රචාරණය වන පිණිස යාච්ඤා කරන්න.

**දෙසැ:10**- ලොව පුරා සිටින සියලුම ආගම් අතර සාමය සහ සමගිය ඇතිවන පිණිස යාච්ඤා කරන්න.

**දෙසැ:11**- ලොව පුරා පවතින සුළි සුළං, භූමිකම්පා වැනි ස්වභාවික විපත් වලින් ආරක්ෂාව වන පිණිස යාච්ඤා කරන්න.

**දෙසැ:12**- ලොව පුරා සිටින නව යෞවනයින් සහ තරුණයින් අතර තිබෙන සියදිවි හානිකර ගැනීමේ වැඩි ප්‍රවණතාවය ඉවත්වන පිණිස යාච්ඤා කරන්න.

**දෙසැ:13**- ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේශන් පාසලේ සහ නෙහෙමියා මියා බයිබල් විද්‍යාලේ සියලු ශිෂ්‍යයින්ගේ සහ ගුරුවරුන්ගේ දිවිය ආරක්ෂාව උදෙසා යාච්ඤා කරන්න.

**දෙසැ:14** - ලොව පුරා සිටින්නාවූ සියලුම පාලකවරුන් සහ මිෂනාරි සේවකයින්ව දෙවියන් වහන්සේ ආරක්ෂා කරන පිණිස යාච්ඤා කරන්න.

**දෙසැ:15**- අපගේ ප්‍රධාන සභාවේ සහ ශාඛා සභාවන්වල සිටින්නා වූ සියලුම ඇදහිලිවන්තයින්ගේ ආත්මික සහ ශාරීරික යහ පැවැත්ම උදෙසා යාච්ඤා කරන්න.

**දෙසැ:16** - අපගේ සංවිධානයට සුදුසු සහ කැපවූ සේවකයින් බඳවා ගන්නා පිණිස යාච්ඤා කරන්න.

**දෙසැ:17**- අපගේ කාර්යාලයේ සහ මුද්‍රණාලයේ සේවක කණ්ඩායම සේවා කටයුතු වල යෙදෙන විටදී ඔවුන්ව ආරක්ෂිතව සහ සෞඛ්‍ය සම්පන්නව තබා ගැනීමට දෙවියන් වහන්සේගේ හස්තය ඔවුන්ට ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**දෙසැ:18**-- සියලු ජාතින් අතර සමගිය සහ සාමය ඇතිවන පිණිස යාච්ඤා කරන්න.

....Contd. from page 4



***Maintaining a close and consistent walk with Him***

දෙවියන් වහන්සේ සමග දෙවියන් වහන්සේ සමග අවශ්‍යය. දෙවියන් වහන්සේ සමග තිබෙන අපගේ සම්බන්ධතාවයන් නිසි ආකාරයෙන් නොතිබෙනවා නම්, අපට අපවද අපගේ පවුලද අපගේ සභාවද අපගේ නගරයද හා අපගේ ජාතියද ආරක්ෂා කර ගැනීමට අපට බැරිය.

## 4). වචනය 'අතර'

තවත් කාරණයක් නම් සතුරා පැමිණ තිරිඟු අතර කිරිඳි වැපිරුවේය. සතුරා එම බීජ වපුරනු ලැබුයේ වෙනත් ස්ථානයක නොව හොඳ බීජ අතරයි. එනම්, දෙවියන්වහන්සේ තම උතුම් ගැලවීම ලබා දී එම මනුෂ්‍යයන්ව ගැලවීම තුළට ගෙන යනු ඇත. අප නිදා සිටිනවා නම් සතුරා අප අතරටද පැමිණි වැරදි දේ වපුරනු ඇත.

සතුරා නිතරම බලා සිටින්නේ අප අතර වැරදි දේ වපුරන්නේ කුමන අවස්ථාවේදීද කියාය.




***Thief steals our joy, peace and health***

මා සිතනවා අප අතරද වැරදි බීජ දැමීමට හැකි වන්නේ කුමන අවස්ථාවේදී දැයි කියා සතුරා බලා සිටිනව කියා. අප දන්නවා හොඳ බීජ අතර කිරිඳි වපුරන විට එම කිරිඳි හොඳ බීජ වල වර්ධනයට විශාල බාධාවක් සිදු කරන බව. ඒ ආකාරයට අප අතරත් අප පවුල අතරත් අපගේ සභාවත් අතරත් මිතුයින් අතරත් සේවය කරන්නා වූ අය අතරත් අපගේ ප්‍රීතිය හා සමාදානයද සෞඛ්‍යභාග්‍යත්වයද සොරකම් කරන පිණිස අප අතර යක්ෂයා වැරදි දේ වපුරනු ඇත. එවිට අපගේ සම්බන්ධතාවයන් කැඩී යයි. එබැවින් අප යක්ෂයාගේ කූට උපක්‍රම සහ ඒ ගැන දැනගන්නා පිණිස අවදියෙන් සිටීමටමට අවශ්‍යය.



***Be as shrewd as snakes and as innocent as doves***

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සෙනග අතර සිටින විට යක්ෂයාගේ සියලු නපුරු සිතුවිලි උන්වහන්සේට දැනුනාය කියා දේව වචනය පවසයි. මුර්කාරයෙකු ලෙස අවදිව සිට අපගේ සිතුවිලි ගැන අවධානයේ සිටිය යුතු බව යේසුස් වහන්සේ අපට මෙසේ අවවාද කරයි. *''වෘකයන් මැදට බැටළුවන් මෙන් මම නුඹලා යවමි. එහෙයින් සර්පයන් මෙන් නුවණ ඇතිව පරවියන් මෙන් අහිංසකව සිටපල්ලා." (මතෙව් 10:16)*

ශුද්ධාත්මයාණන් වහන්සේ අපව සියලු සත්‍යතාවයන් තුළට මග පෙන්වයි. එනිසා උන්වහන්සේගේ සේවය අප අගය කළ යුතුයි. උන්වහන්සේගේ අභිමුඛත්වය තුළ අප නිතරම සිටිය යුතුයි. අපට නිතරම මග පෙන්වීමට උන්වහන්සේට ඉඩ දිය යුතුයි. හොඳ මනුෂ්‍යයන් අතර නපුරු අදහස් ඇති මනුෂ්‍යයන්ද සිටින බව අප තේරුම් ගත යුතුයි. එම මිනිසුන්ට අප අගයක් වෙන එක අමාරුයි. නමුත් අප ඒ අය ගැන ඉතා අවධානයෙන් සිටිය යුතුයි. ඔබව මුලා කිරීමටවත් කිසි කෙනෙකුට ඔබව අයුතු ලෙස ප්‍රයෝජනය ගැනීමටවත් ඉඩ නොදෙන්න. හැම විටම අවධියෙන් සිටින්න.

## 5). වර්ධනය වීමට ඉඩ දෙන්න

මෙම උපමා කතාවෙන් තිරිඟු සහ කිරිඳි යන දෙකම එක වගේ තිබුණි. මතෙව් 13:26 පදය අප කියවනවිට තිරිඟු හා කිරිඳි යන දෙකම එකට වැඩී එක සමානව තිබුණේය කියා පවසයි. දෙවර්ගයේම එක වගේ තිබු නිසා සමහර විට අපට ඒවා අඳුරා ගැනීමට අමාරුයි.

සේවකයින් ගොස් තම අයිතිකාරයා ගෙන් මෙසේ අසනු ලබයි; *''.......ස්වාමීනි, ඔබගේ කෙතෙහි ඔබ හොඳ බීජ වපුලා නොවේද? එසේ වී නම් කිරිඳි කොයින්දැයි ඔහුට කීවෝය." (මතෙව් 13:27)* තිරිඟු අතර මෙම කිරිඳි වැඩුනේ කෙසේද යන්න ගැන සිතා,

නිදා සිටි සේවකයින් පුදුමයට පත් වූවෝය. බොහෝ අවස්ථාවන්වලදී අපිට පැමිණෙන්නා වූ විවිධ අත්දැකීම් තුළදී අප දෙවියන්වහන්සේගෙන්; මගේ ජීවිතයේ මෙලෙස සිදුවූයේ ඇයි? මේ දේ මටම වෙන්නේ ඇයි? කියා ප්‍රශ්න කරමු.

මෙහිදී අප තේරුම් ගත යුතු කාරණය නම්; ස්වාමියා තිරිඟු අතර නරක බීජ වැපිරුවේ නැතැයි කියාය. දෙවියන් වහන්සේ නිතරම අපට යහපත් දේ පමණක් පවසයි. දෙවියන් වහන්සේ අපට නපුරු දේ තුළින් නොව ස්වර්ගයක දේ වලින් පෝෂණය කරයි.

''සෑම යහපත් දීමද සෑම සම්පූර්ණ දීමනාවද කිසි වෙනස් වීමක්වත් හැරීමේ ඡායාවක්වත් නැත්තා වූ ආලෝකවල පියාණන් වහන්සේ කෙරෙන් ඉහළින් බැස එන්නේය."

මෙම තිරිඟු වැඩෙන විට ස්වාමියා පවසන්නා වූ ඉතා සරල පිළිතුරු නම්; ''ඒවාත් වැඩෙන්න ඉඩ හරින්න", කියාය. බොහෝ අවස්ථාවන්වලදී අප දකින දෙය නම්, දෙවියන් වහන්සේව ප්‍රිය නොකරන අය සවලවත් වන විට දෙවියන් වහන්සේට අවංකව සිටින්නා වූ අය විවිධාකාර ප්‍රශ්න හා කරදර තුළින් ගමන් කරන බවයි. එවිට අප අසන ප්‍රශ්නය නම්, 'අනෙක් අය හොඳින් සිටින විට දේව දරුවන් දුක් විඳින්නේ ඇයි?' කියාය.



*The reply of the owner - "Let them grow"*

එයට දෙවියන්වහන්සේ දෙන පිළිතුර නම්; ''ඔවුන් වර්ධනය වුනාවේ'' කියාය. අප සිතනවාට වඩා දෙවියන් වහන්සේ කරුණාවන්තයි. මනුෂ්‍යයන්ට වෙනස් වීමට දෙවියන් වහන්සේ ඉඩ ප්‍රස්ථාව ලබා දෙයි.

දෙවියන්වහන්සේ; ''ධර්මිෂ්ඨයින්ටත් අධර්මිෂ්ඨයින්ටත් ඉර පායන්නට සලස්වයි." කියා පවසයි. නමුත් මතු දවසකදී මේ සෑම දේම ආලෝකය වෙත ගෙන එයි. මෙය අස්වැන්න නෙළා ගන්නා දවසයි.

## 6) අස්වැන්න නෙලා ගැනීමේ වේලාව !

සේවකයෝ කිරිඳි ටික ගලවා විසි කිරීමට සූදානම් වූ විට ස්වාමියා පවසන ලැබුවේ; 'දෙකම එකට වර්ධනය වීමට ඉඩ දෙන්න මන්ද තිරිඟු සහ කිරිඳියන දෙවර්ගයම අස්වැන්න නෙලා ගන්නා වේලාවේදී එම දෙකෙහි වෙනස සොයාගත හැකිය.' යනුවෙනි. දෙවියන්වහන්සේගේ විනිශ්චය දවසේදී වෙනස අපිට තේරුම් ගැනීමට හැකිය.

*''කපන කාලය දක්වා දෙවගේම එකට වැඩෙන්ට ඇරපල්ලා. කපන කාලයේදී පළමු කොට කිරිඳි එකතු කර දවන පිණිස මිටි බැඳපල්ලා. නුමුත් තිරිඟු මාගේ අටුවෙහි රැස්කරපල්ලා යයි කපන්නනට කියන්නෙමියි කීවේය." (මතෙව් 13:30)*

අද අප ඇසීමට අවශ්‍ය ප්‍රශ්නය නම්; අප අයිති වන්නේ කුමන ගොඩටද? තිරිඟු ද? නැතිනම් කිරිඳි ද?

දෙවියන්වහන්සේගේ කැමැත්ත නම් අප සදාකාල ජීවනයට යන කොටසට අයිති වෙනවාටය. "ගිනි උදුනෙහි හෙලන්නෝය. එහිදී හැඬීමද දත්මිටි කෑමද වන්නේය." (මතෙව් 13:42) යේසුස් වහන්සේ මේ ලෝකයට පැමිණුනේ; අපගේ පාපය, ශාපය, රෝගය හා හිස් භාවය කල්වාරි කුරුසේදී දරාගෙන මරණයෙන් ජය ගත්තේ අපට ජයග්‍රහණය දෙන පිණිසය.

....Contd. to page 10

ECHO OF HIS CALL REACHING NATIONS SINCE 1969 1969 TO 2029

NEHEMIAH BIBLE COLLEGES,

Qualification : 10th Standard & above

Chepauk & Santhoshapuram, Velachery Chennai.

Rush for admission! Medium :Tamil (Part Time) Hindi (Residential) (Sponsorship Available)

Diploma in Theology

Recognised by International Christian Leaders & Senior Pastors for the past 56 years

Contact : The Chairman, Nehemiah Bible College.

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.

Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858

E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

**"...කියවන්නා තේරුම් ගනීවා...."** *(මතෙව් 24:15)*



## අහස්යානයෙන් මා ඉගෙනගත් පාඩම !

*"නපුරු මනුෂ්‍යයෝ යුක්තිය තේරුම් නොගනිති; එහෙත් ස්වාමීන්වහන්සේගෙන් විභාග කරන්නෝ සියල්ල තේරුම් ගනිති." (හිතෝපදේශ 28:25)*

1970 වන වර්ෂයේදී නාසරෙතුපෙට් යන කුඩා ගම්මානයේ එක්තරා දුප්පත් කාන්තාවක් යක්ෂ ආත්මයක් ආවේශ වී සිටි නිසා ඇයට යාච්ඤා කරන පිණිස මගේ මිත්‍රයා මාවද රැගෙන ගියේය. වෛද්‍යවරුන්ට සුව කිරීමට නොහැකි බොහෝ ලෙඩ රෝගය ඇයට තිබුණි. එය සවස් කාලයක් නිසා අප එම ස්ථානයේ සිට එදා මුළු රාත්‍රියේම යාඥා කළෙමු. දෙවියන් වහන්සේ අපගේ යාඥාවට පිළිතුරු දී එම කාන්තාව ඉතා පුදුමාකාර ලෙස සුව කළේය.

පසුදින උදෑසන මා ළඟ තිබූ කුඩා මුදලින් එම ගම්මානයෙන් මා උදෑසන කෑම ගත් පසු ඉන් පිටතට පැමිණි විට බස් රථයට ගෙවීමට මුදල් අඩුපාඩුවක් තිබෙන බව මට දැනුණි. නමුත් මා ළඟ තිබූ ශුභාරංචි පත්‍රිකා රැගෙන පාර දිගේ ඒවා බෙදමින් ඇවිදින්නට පටන් ගත්තෙමි. ටික වේලාවකට පසු මට බඩගිනිවී මහන්සියට පත් වුනෙමි.

ශුද්ධාත්මයාණන් වහන්සේ මට නැවත නිවසට පැමිණෙන්නට අවස්ථාව දුන්නේ නැත. උන්වහන්සේ පාස්ටර් අබෙද් නෙගෝ මුණගැසීමට මාව ගෙන ගියේය. ඔහු තාම්බරම් හි වැසියන්ට සේවය කළේ. පාස්ටර් අබෙද් නෙගෝ සහ සහෝදර එම්මානුවෙල් පාස්ටර් තෝමස් සහ පොලිසියේ සෙල්ල දුරෙයි යන මේ සියලු දෙනාම එතනදී නිරාහාරව යාච්ඤා කරමින් සිටියෝය.

එම යාච්ඤා අවසන් වූ විට පාස්ටර් අබිද් නෙගෝගේ භාර්යාව මා කුසගින්නෙන් සිටින බව දැක මට කෑම ලබා දුන්නේය. සහෝදර සෙල්ල දුරේයි, ඔහුට ගුවන් තොටුපලෙහි රාජකාරි කිරීමට යාමට සිදුවූ නිසා මටත් ඔහු සමග එන්නය කියා පැවසුවේය. මට ඔහු සමග පැමිණෙන්න ඒවා බලන්නය කියා පවසනු ලැබීමෙන් ඔහුට අවශ්‍ය වූයේ මගේ මනසේ තිබූ වෙහෙස ඉවත්කොට සේවයේ තිබූ අපහසුතා ඉවත දමා මනසට නිදහසක් ලැබෙන පිණිසය.

මා ගුවන් තොටුපළට යන විටදී කිසියම් ගුවන් යානයක තිබූ කාර්මික දෝෂයක් නිසා එහි සිටි සියලු දෙනාටම එයින් බහින්නය කියා පවසනු ලැබීය. ඉන් විනාඩි කීපයකටකට පසුව ඉතා දක්ෂ කාර්මිකයන් කණ්ඩායමක් පැමිණ මෙම ගුවන් යානය පරීක්ෂා කරනු ලැබුවත් ඔවුන්ට එහි තිබූ දෝෂය සොයාගෙන නැවත එය සෑදීමට අසමත් විය. පසුව තවත් ස්ථානයකින් ඉංජිනේරුවරු එහි පැමිණි අතර ඔවුන් ද මෙය සෑදීමට වෑයම් කළේය.

මෙහි සිටි සියලු මගීන් ඉතා කලබලයට පත්වී, "කැඩුණු ගුවන් යානය පාවිච්චි කරන්නේ ඇයි?" කියමින් ප්‍රශ්න කළෝය.

පැය තුනකට පමණ පසුව ඉංජිනේරුව බොහෝ වෙහෙස මහන්සි වී එම ගුවන් යානය යථා තත්ත්වයට පත් කළෝය. අතරමං වී සිටි මගීන් සියලු දෙනාම එම ගුවන් යානයට ගොඩවුවෝය. මා එහි සිටි නිසා මටද එයට ඇතුල් වෙන්නය කියා පවසනු ලැබීය. දෙවියන් වහන්සේ මට ඉගැන්නු කාරණය නම් එම පළුදු වූ ගුවන් යානය හිමින් ගමන් කිරීමට පටන් ගත්තේය. ඉන්පසු බොහෝ බලය ඇතුව අහසේ ඉහළටම නැගීමට පටන් ගත්තේය. සුළු වේලාවකට කලින් ක්‍රියා විරහිතව තිබූ අහස් යානාව දැන් ඉතා බලවත් ලෙස ගමන් කිරීමට පටන් ගත්තේය.

දෙවියන් වහන්සේ මා හට කතා කිරීමට පටන් ගත්තේය, "මාගේ පුතු වූ සෑම්, අද ඔබව අමතක කළා කියා ඔබ සිතන්නට පුළුවනි. එසේම ඔබ කිසිම දෙයකට ප්‍රයෝජනයක් නැත කියාත් සිතනවා විය හැක. නමුත් ඔබ යා යුතු ස්ථානයට ගමන් කිරීමට නම්, ඔබ ඇදහිල්ලෙන් ගමන් කළ යුතුය. මෙම ගුවන් යානය පළුදු වී තිබුණු නමුත් එය යථා තත්ත්වයට පත් කරමින් නැවත එය ගමන් කිරීමට

## MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** - Monthly Magazines :English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikaans.
3. **BIBLECOR -** Basic Bible Courses (English, Tamil & Hindi)
4. Theological Correspondence Courses: English & Tamil
5. Nehemiah Bible Colleges (Chepauk, Santhoshapuram & Velachery)
6. Branch Churches: Santhoshapuram, Balaji Nagar & Velachery
7. Great Commission Partners (Network of Pastors)
8. Training Programmes – Seminars & Retreats
9. Crusades
10. Literature Distribution and Follow Up
11. Gospel Printing Press - Publications
12. St. Paul's Matriculation School - Village English High School
13. Sunday Schools (Chepauk) : 10.30 a.m. Sunday & (Velachery, Balaji Nagar & Santhoshapuram) 3.00 p.m. Sunday
14. **Early Morning Service : 5.30 a.m. Sunday**
15. **Preliminary Service : 8.00 a.m. Sunday**
16. **Tamil Service : 8.30 a.m. Sunday**
17. **Youth Meeting : 11.00 a.m. Sunday**
18. **Fellowship Lunch : 1.00 p.m. Sunday**
19. **Telugu Service : 4.00 p.m. Sunday**
20. **Hindi Service : 5.00 p.m. Sunday**
21. **Tamil & English Service : 6.00 p.m. Sunday**
22. Feedback Time : 7.30 p.m. Sunday
23. Women's Prayer : 5.30 p.m. Wednesday
24. Men's Prayer : 7.30 p.m. Friday
25. Discipleship Meeting : 6.00 p.m. Saturday
26. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
27. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
28. Ministers' Meeting : 5.30 p.m. First Saturday
29. Parents' Prayer : 4.00 p.m. First Sunday
30. Night Prayer : 9.30 p.m. Third Friday
31. Fasting Prayer : 9:30 a.m. Second Saturday
32. Holy Communion : Second Sunday Service
33. Youth / Kid Prayer : 10.00 p.m. daily (over phone)
34. Staff Devotion : 9.00 a.m. daily
35. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

පුළුවන් තත්ත්වයට වෙනස් කරනු ලැබුවේය. ඒ ආකාරයට මා නියම කළ කාලයට මගේ වේලාවට මා නුඹට ආශිර්වාද කරමින් එම ගුවන් යානාව බොහෝ අයව රැගෙන ගියාක් මෙන් ඔබත් බොහෝ අයව රැගෙන යන කෙනෙක් කරමි. බිය නොවන්න මම නුඹ සමගයි.''

නැවත මගේ ස්ථානයට 20km පමණ ඇවිදගෙන ආවෙමි. අද ඒ ගැන මා හට සාක්ෂි දැරීමට පුළුවනි. එදා දෙවියන් වහන්සේ මට කතා කළ දේ අද උන්වහන්සේ මගේ ජීවිතයෙහි ඉෂ්ට කර තිබේ.

සමහර විට මේ මොහොතේදී ඔබ වෙහෙසට පත් වී දුකෙන් හා කරදර පීඩාවන්ට ගොදුරු වී බොහෝ අභියෝගවලට මුහුණ දී සිටින්නට පුළුවනි. නමුත් දැන් ඔබ බිය නොවන්න. මන්ද දේව වචනය මෙසේ පවසයි.

*''නුඹලා වනාහි ස්වාමින්වහන්සේගේ පූජකයෝ යයි කියනු ලබන්නෝය. මනුෂ්‍යයන් නුඹලාට අපේ දෙවියන් වහන්සේගේ සේවකයෝ යයි කියනවා ඇත. නුඹලා ජාතීන්ගේ සම්පත් භුක්ති විඳ, ඔවුන්ගේ තේජස හිමිකර ගන්නවා ඇත.'' (යෙසායා 61:6)*

*************

Posted at "Egmore RMS Patrika Channel" RNI NO. TN/SIH/2006/17846

....Contd. from page 7

දෙවියන්වහන්සේ පොරොන්දු ආකාරයට නැවතත් උන්වහන්සේ පැමිණෙන්නේය. උන්වහන්සේ නැවත මේ ලෝකයට පැමිණෙන්නේ මනුෂ්‍යයන් විනිශ්චය කරන පිණිසය. අපට විනිශ්චයෙන් බේරීමට ඇති එකම මාර්ගය නම්; යේසුස් ක්‍රිස්තුස් වහන්සේය. අප උන්වහන්සේව අපගේ ජීවිතයට පිළිගත්තහොත් අපට ආශීර්වාදය හිමි වෙනු ඇත.

මතෙව් 13:43 හි මෙසේ පවසයි; "එකල ධර්මිෂ්ඨයෝ තමුන්ගේ පියාණන්ගේ රාජ්‍යයෙහි සූර්යයා මෙන් බබලන්නෝය. ඇසීමට කන් ඇත්තේ අසාවා."

අප සූර්යයා මෙන් බැබලීම දෙවියන් වහන්සේගේ කැමැත්තයි.

ප්‍රශ්නය නම්; අප උන්වහන්සේ උදෙසා බැබළෙන්නාවූ අයද ? අප තිරිඟු ද? එසේත් නොමැති නම් කිරිඳිද? අප අවදියෙන් සිටිනවාද? නැතිනම් අප නිදාගෙන සිටිනවාද?

************

## NOTICE

Save our mobile numbers (+91) 98410 71858, (+91) 98412 71858 (main numbers) in your mobile phones. - Editor

# ECHO OF HIS CALL

Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.

Annual Subscription : Rs. 100/- Life Subscription : Rs. 2000/-

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps (**Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.**) to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :
ECHO OF HIS CALL
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.org

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS Patrika Channel"**
**on 3rd NOVEMBER 2025.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

*JESUS LOVES YOU!*

To

*GOD BLESS YOU!*

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**